**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2025**

**--------------------------------------------------------**

පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරන ණය ගිවිසුමේ 01 වගන්තිය හි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර, සබරගමුව, නැඟෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම සහ උතුරු පළාත් වල මගී සහ භාණ්ඩ ප්‍රවාහන සහ වාහන මෙහෙයුම් සහ මාර්ග නඩත්තු වියදම්, ප්‍රවාහන කාලය සහ අනතුරු අවම කිරීම මගින් අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම සඳහා පදික වේදිකා සහිත මංතීරු දෙකකින් සමන්විත පාලම් 25 ක් නැවත ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැකේජ 01, 02 සහ 03 ලෙස සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 4,632 කට සමාන එ.ජ.ඩො. මිලියන 35.41 ක් වන අතර එය අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 සැප්තැම්බර් 07 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 05 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය ප්‍රථමයෙන් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් පසුව 2025 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ මතය අනුව, මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණු වල බලපෑම් හැරුණු විට, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන මගින් 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.1 වන ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක DMA/02/2024 දරන චක්‍රලේඛයේ 5 වන වගන්තියට අනුව, ව්‍යාපෘතියක් අවසන් කිරීමේදී එහි ගිණුම් වසා දැමීමට පෙර සියලු වත්කම් පවරා දී ඇති බවටත්, සියලු වගකීම් නිරවුල් කර ඇති බවටත් වග බලා ගත යුතුය. එසේ වුවද, අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 2,565.35ක් ලෙස දක්වා ඇති වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දී නොතිබූ අතර, රු. මිලියන 396.91ක් වූ වගකීම් ද නිරවුල් කර නොතිබුණි. | 2,962 | එකඟ නොවේ. විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (SPMU) යටතේ පැවති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 ජනවාරි 31 දින වසා දමන ලදී. එම ඒකකය වසා දැමීමෙන් අනතුරුව, මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) ඒකකයක් ලෙස එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයවනු ලබන අතර, ඉතිරි කටයුතු දේශීය අරමුදල් භාවිතයෙන් අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. එම තීරණයට අනුකූලව ව්‍යාපෘතියේ අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර, ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට තීරණය කර ඇත. | චක්‍රලේඛයට අනුව, ගිණුම් වසා දැමීමට පෙර සියලු වත්කම් පවරාදිය යුතු අතර සියලු වගකීම් පියවිය යුතුය. |
| (ආ) | 2021 සහ 2022 වර්ෂවලදී රු. මිලියන 3,041.87ක් වූ මුළු ඉදිකිරීම් වටිනාකමකින් යුත් පාලම් 20ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබුණද, අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනයේ එම පාලම්වල වටිනාකම රු. මිලියන 2,702.63ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, මෙම ශේෂයන් අතර රුපියල් මිලියන 339.24ක වෙනසක් නිරීක්ෂණය විය. | 339.24 | එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන අත්සන් තැබීමට පෙර, ගණකාධිකාරීවරයා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රී. ලං. රා.ගි.ප්‍ර) අනුකූල වීම තහවුරු කළ යුතුය. |

**2.2 නීති රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම.**

| | නීති, රීති රෙගුලාසි යොමුව | අනුකූල නොවීම /විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2024 ඔක්තෝබර් 24 දිනැති හා අංක DMA/02/2024 දරන චක්‍රලේඛය සහ 2025 මැයි 27 දින නිකුත් කරන ලද වත්කම් පවරා දීම සම්බන්ධ අතිරේක මාර්ගෝපදේශය | ව්‍යාපෘතිය විසින් රු. මිලියන 20.28ක් වටිනා පරිගණක, ලැප්ටොප් සහ රථවාහන ගණන් කිරීමේ පද්ධතියක් (Traffic Counter System) අසම්පූර්ණ ආකෘති පත්‍ර භාවිත කරමින් පවරා දී තිබුණි. මුදල් රෙගුලාසි අංක 753(1) සහ (2) ට අනුකූලව වත්කම් නිකුත් කිරීම සහ භාර ගැනීම සඳහා භාවිත කෙරෙන පොදු ආකෘති පත්‍ර අංක 141 සහ 219 හා සසඳන විට, එම වත්කම් හුවමාරු කිරීම සහ භාර ගැනීම සඳහා යොදාගත් ලේඛන අසම්පූර්ණව පැවති අතර, ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශයේ 5.5 වන ඡේදයට අනුකූලව ද එම වත්කම් හුවමාරු කර නොතිබුණි. | එකඟ නොවේ. මෙම වත්කම් 2018 – 2021 **කාලසීමාව තුළ පවරා දීම සිදු කර තිබූ අතර** කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2024 ඔක්තෝබර් 24 දිනැති අංක DMA/02/2024 දරන චක්‍රලේඛය යටතේ ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2025 මැයි 27 දින වත්කම් පවරා දීම පිළිබඳ අතිරේක මාර්ගෝපදේශය නිකුත් කිරීමට පෙර පවරා දී තිබුණි. එබැවින්, මෙම සියලු වත්කම් පවරාදීම් 2018–2021 කාලසීමාව තුළ බලපැවැත්වූ අදාළ චක්‍රලේඛවල විධිවිධාන අනුව සිදු කර තිබුණි. | ව්‍යාපෘතියේ වත්කම් මුදල් රෙගුලාසිවලට අනුකූලව පවරා දිය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දී, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් 2020 ඔක්තෝබර් 20 දින වසා දමන ලද ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය (MBCP) වෙත, අදාළ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු. මිලියන | එම කාලසීමාව තුළ පොල්ලතුමෝදර පාලම සඳහා ඉඩම් අත්පත් කරගත් ඉඩම් හිමියන් විසින් විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කර තිබුණි. MBCP වැය ශීර්ෂය යටතේ ප්‍රමාණවත් අක්මුදල් (Imprest) | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයා විසින් මෙම ගනුදෙනුව සමාලෝචනය කර, ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 10.1ක මුදලක් ගෙවා තිබුණි. එබැවින්, මුදල් රෙගුලාසි 127, 128 සහ 129 උල්ලංඝනය කරමින්, කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් ලබා ගැනීමකින් තොරව ඉහත රු. මිලියන 10.1ක මුදල ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර මුදල නැවත අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | නොතිබීම හේතුවෙන්, පාලම් 25 ව්‍යාපෘතිය යටතේ පැවති අක්මුදල් භාවිත කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අතපසු වී තිබුණි. අනතුරුව, MBCP ව්‍යාපෘතිය 2020 වර්ෂයේ දී අවසන් කිරීම හේතුවෙන්, එම ව්‍යාපෘතියෙන් අදාළ මුදල නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | |
| (ආ) | කොන්ත්‍රාත්කරු විසින් කිසිදු අනුරූපී භෞතික ප්‍රගතියක් නොමැතිව වසර 03කට වැඩි කාලයක් වැඩ පූර්ව අත්තිකාරම් මුදල රඳවා ගෙන තිබුණි. අයකර ගැනීමේ විධිමත් යාන්ත්‍රණයක් සහ පොලී අවම කිරීමේ සැලැස්මක් නොමැති වීම හේතුවෙන්, පැකේජ අංක 02 යටතේ ප්‍රමාද ගෙවීම් සඳහා පොලී ඉල්ලා සිටීමට ඇති හිමිකම පවත්වා ගනිමින් සහ වැඩපූර්ව අත්තිකාරම් අඛණ්ඩව භාවිත කිරීම මගින් කොන්ත්‍රාත්කරු විසින් ද්විත්ව මූල්‍ය ප්‍රතිලාභයක් ලබාගෙන තිබුණි. මෙම කරුණ මේ දක්වා නිරාකරණය කර නොතිබීම හේතුවෙන්, එය කොන්ත්‍රාත් පරිපාලනයේ සහ මූල්‍ය කළමනාකරණයේ අඩුපාඩුවක් පිළිබිඹු කරන අතර, එමගින් රජයට අහිතකර මූල්‍ය බලපෑම් ඇතිවීම ඉඩ සලසා තිබුණි. | එකඟ වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් විශේෂ අවධානය යොමු කර, වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීම සහ ගෙවීම් සම්බන්ධයෙන් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමේ 11.9 උප වගන්තිය අනුව, ඉංජිනේරුවරයා විසින් කාර්යසාධන සහතිකය නිකුත් කරන තෙක් කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධනය සම්පූර්ණ වූ බවට සැලකිය නොහැක. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබූ සියලුම පාලම් සඳහා එවැනි කාර්යසාධන සහතික නිකුත් කර නොතිබූ අතර, එම පාලම්වල දෝෂ සඳහා වගකීම් කාලයන් (Defects Liability Periods) ද මේ වන විට අවසන් වී තිබුණි. එබැවින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කොන්ත්‍රාත් විධිමත්ව අවසන් කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කර | එකඟ වේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් විශේෂ අවධානය යොමු කර කාර්යසාධන සහතිකය නිකුත් කිරීමේදී ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. තවද, මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබූ අතර, එමඟින් කොන්ත්‍රාත්කරුට අයුතු මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව සලසා දී තිබුණි. | | |
| (ඇ) | 2024 ඔක්තෝබර් 24 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2/2024 යටතේ නිකුත් කරන ලද ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශයේ 5 වන පරිච්ඡේදයට අනුව, ව්‍යාපෘති අවසන් කිරීම සහ වත්කම් පවරා දීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි පැහැදිලිව දක්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ කටයුතු එම මාර්ගෝපදේශයට අනුකූලව සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 ජනවාරි 31 දින සිට වසා දමා තිබුණි. කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2/2024 යටතේ වන ව්‍යාපෘති කළමනාකරණ මාර්ගෝපදේශය 2024 වසරේදී නිකුත් කර ඇත. එබැවින්, මෙම මාර්ගෝපදේශ අදාළ නොවේ. කෙසේ වෙතත්, වත්කම් භාර දීමේදී එම කාලසීමාව තුළ ක්‍රියාත්මකව පැවති මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී. | ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් විශේෂ අවධානය යොමු කර, ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| i. | 5.2 වගන්තිය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමේදී සහ වත්කම් පවරාදීමේදී, ව්‍යාපෘතියේ කාර්යයන්හි ස්වභාවය මත පදනම්ව ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා විස්තරාත්මක සැලැස්මක් සකස් කළ යුතුය. එහිදී අදාළ පාර්ශ්වයන් හඳුනාගෙන, ඔවුන්ගේ වගකීම් හා රාජකාරි පැහැදිලිව නිර්වචනය කර, කටයුතු අවසන් කිරීම සඳහා නිශ්චිත කාල රාමුවක් ද ස්ථාපිත කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා එවැනි විස්තරාත්මක සැලැස්මක් සකස් කර නොතිබුණි. | එකඟ වේ. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| ii. | ව්‍යාපෘතියක් අවසන් කිරීමේදී එම ව්‍යාපෘතියට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම්, උපයෝගිතා සේවා බිල්පත් සහ අනෙකුත් සියලුම වගකීම් 5.7 වගන්තියට අනුව නිරවුල් කළ යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 63.21ක් වූ උපචිත වියදම් සහ රු. මිලියන 252.04ක් වූ විදේශ ආධාර ගෙවිය යුතු ශේෂය (Foreign Aid Payable) 2026 මාර්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | එකඟ වේ. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii | 5.8 වගන්තියට අනුව, ව්‍යාපෘතිය වෙනුවෙන් විවෘත කර ඇති සියලුම බැංකු ගිණුම්වල ශේෂයන් ශුන්‍ය බවට පත් කිරීමෙන් අනතුරුව, බැංකු ගිණුම් වසා දැමීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (TOD) විසින් නිකුත් කරන ලද TOD/BA/03 ආකෘති පත්‍රය, අදාළ අනෙකුත් ලේඛන සමඟ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 2/2022 හි 6 වන ඡේදයේ සඳහන් උපදෙස්වලට අනුකූලව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ලංකා බැංකුවේ අංක 7040419 දරන ව්‍යාපෘති බැංකු ගිණුම 2026 මාර්තු 31 දින වන විටත් වසා දමා නොතිබුණි. | ව්‍යාපෘතියේ අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විටත් ව්‍යාපෘති බැංකු ගිණුම වසා දමා නොතිබුණි. මේ වන විට ලංකා බැංකුවේ අංක 7040419 දරන ගිණුම වසා දැමීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| iv | 5.12 වගන්තිය අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් අනතුරුව, ගෙවීම්වලට අදාළ සියලුම අතිරේක ලේඛන, වාර්තා සහ ගිණුම් පොත් ක්‍රියාත්මක කරවීමේ ආයතනය (Executing Agency) වෙත පවරා දිය යුතුය. කෙසේ වෙතත්, එවැනි ලේඛන, වාර්තා, ගිණුම් පොත් සහ ගෙවීම් පිළිබඳ විස්තර අදාළ ආයතනය වෙත පවරා දී නොතිබුණි. ඒ හේතුවෙන්, අතීත ගෙවීම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කිරීම, ගෙවිය යුතු වගකීම් සත්‍යාපනය කිරීම සහ මූල්‍ය වාර්තා සංසන්ධනය කිරීමේදී අදාළ ආයතනයට දුෂ්කරතා ඇතිවිය හැකි අතර එමෙන්ම නිසි ලේඛන හා වාර්තා නොමැතිවීම හේතුවෙන් අනුකූලතා ගැටලු, ආරවුල් සහ තීරණ ගැනීමේදී අභියෝග ඇතිවිය හැකිය. | එකඟ නොවේ. 'පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය' මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) තුළ ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන බැවින්, සියලුම ගෙවීම් සිදු කරනු ලබන්නේ එම අධිකාරියේ මූල්‍ය අංශය මගිනි. අනාගතයේදී මෙම ඒකකය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නිසි පරිදි භාර දෙන අවස්ථාවේදී, අදාළ ලේඛන, වාර්තා සහ පොත්පත් භාර දීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| v | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ව්‍යාපෘතියේ අරමුණු, මුහුණ දුන් අභියෝග, උගත් පාඩම්, ඉදිරියේ දී ගත යුතු යෝජිත ක්‍රියාමාර්ග සහ තිරසාර භාවයට අදාළ කරුණු ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් 5.13 වගන්තිය අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව පෙර | එකඟ වේ. මෙම ව්‍යාපෘති ඒකකය සඳහා ඒකක ප්‍රධානියෙකු මාර්ග සංවර්ධන අධිකාරියෙහි (RDA) අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කිරීමෙන් අනතුරුව, සවිස්තරාත්මක ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාවක් සකස් කරනු ලැබේ. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ වත්කම්වල ශේෂයන්, ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු පැවති ශේෂයන් සහ සත්‍ය වශයෙන් පවරා දුන් ශේෂයන් පිළිබඳ විස්තර ඇතුළත් සංසන්දනය කිරීමේ ප්‍රකාශයක් (Reconciliation Statement) ද අවසන් වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම අගයන් අතර කිසියම් වෙනසක් පවතින්නේ නම්, ඒ සඳහා සම්පූර්ණ පැහැදිලි කිරීමක් ද ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාමාර්ග මඟින් අනාගත ව්‍යාපෘති සඳහා ලබාගත් පාඩම් හඳුනා ගැනීමට, වැරදි මූල්‍ය ප්‍රකාශනයන්, වත්කම් අවභාවිතය සහ වත්කම් අහිමිවීමේ අවදානම අවම කිරීමට මෙන්ම, ව්‍යාපෘති අවසන් කිරීමේදී විනිවිදභාවය, වගවීම සහ ඵලදායී පාලනය වැඩිදියුණු කිරීමට හැකි වේ. කෙසේ වෙතත්, එවැනි වාර්තාවක් සහ අදාළ පැහැදිලි කිරීම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| vi | අදාළ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම, ව්‍යාපෘතියේ කාර්යසාධනය, සියලුම වත්කම් පවරා දීම, වගකීම් නිරවුල් කිරීම සහ ව්‍යාපෘතියේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ආවරණය වන පරිදි විස්තරාත්මක වාර්තාවක් 5.15 වගන්තියට අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එවැනි විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ නොවේ. 2023 ජනවාරි 31 දින ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වසා දැමීමෙන් අනතුරුව, මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරියෙහි ඒකකයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවත්වාගෙන යනු ලබයි. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සහ අවසන් කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |

## 3.2 පද්ධති හා පාලන

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද වන්දි, පොලී ගෙවීම් සහ ප්‍රතිපාදන සම්බන්ධයෙන් | එකඟ වේ. | ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් විගණනය වෙත ඉල්ලා ඇති තොරතුරු |

| | | | |
|---|---|---|---|
| | ලේඛනයක් (Register) පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතියට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ විස්තර 2026 මාර්තු 31 දිනැති ලිපිය මඟින් ඉල්ලා සිටීමෙන් මාසයකට පසුවත්, විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානයේ වන්දි සහ පොලී සඳහා ගිණුම්ගත කර තිබූ රු. මිලියන 68.92ක ගෙවීම් සහ ප්‍රතිපාදනවල සම්පූර්ණත්වය හා නිරවද්‍යතාවය විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය. | | ඉදිරිපත් කළ යුතුය. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් සහතික කළ යුතු අතර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ආ) | ණය දෙන ආයතනය විසින් ණය මුදල් නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලැබූ තීරණයක් මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 ජනවාරි 31 දින වන විට වසා දමා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වසා දමා තිබියදීත්, බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරි පරිශ්‍රයේ කාර්යාලයක් පවත්වාගෙන යමින්, 2025 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලිය ලෙස රු. මිලියන 3.36ක වියදමක් දරා තිබුණි. | ලේකම්වරයාගේ තීරණය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වසා දැමුවද, ව්‍යාපෘති ලේඛන සුරක්ෂිතව තබා ගැනීම සහ අඛණ්ඩව සිදු කෙරෙන මෙහෙයුම් කටයුතු සඳහා පහසුකම් සැලසීම පිණිස එම ඒකකයේ කාර්යාලය පවත්වාගෙන යන ලදී. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, මෙම ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) ඒකකයක් ලෙස එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයවනු ලබයි. තවද, 2024 මාර්තු 18 වන දින පැවති 33 වන NOR රැස්වීමේ දී ගත් තීරණයට අනුව, දේශීය අරමුදල් භාවිතයෙන් ඉතිරි කටයුතු අඛණ්ඩව සිදු කර තිබුණි. ඒ අනුව, 2026 මාර්තු 31 වන දින දක්වා එම කාර්යාල පරිශ්‍රය භාවිතා කල අතර, ඒ සඳහා වන වියදම් මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් දරා තිබුණි. | නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) තවදුරටත් පවත්වාගෙන නොයා යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් නිසි විමර්ශනයක් සිදු කළ යුතුය. |